# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,139 - 2019 අගෝස්තු මස 30 වැනි සිකුරාදා - 2019.08.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 1498 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 1498 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |

*සැ. යු.* - මුදල් පනත් කෙටුම්පත 2019 අගෝස්තු මස 16 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 සැප්තැම්බර් මස 20 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 සැප්තැම්බර් මස 06 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# පළාත් සභා නිවේදන

## වයඹ පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

නිවේදනයයි

අංක 1945 දරන 2015 දෙසැම්බර් මස 11 වැනි දින ප්‍රකාශයට පත් කර ඇති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ) වැනි කොටස - පළාත් සභා නිවේදන යටතේ වයඹ පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 1983 අංක 32 සහ 1992 අංක 11 දරන සමුපකාර සමිති (සංශෝධන) පනත්වලින් සංශෝධිත 1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 57(2) වගන්තිය ප්‍රකාරව ඈවර කර අවසන් කළ සමුපකාර සමිතිවල නාම ලේඛනය යටතේ පහත නම සඳහන් සමුපකාර සමිතිය *ගැසට් පත්‍රයේ* පළ කර ඇත.

| *අනු අංකය* | *සමිතියේ නම* | *ලි.ප. අංකය* | *දිනය* |
|---|---|---|---|
| 208 | සී./ස. තල්විල ශාන්ත තෙරේසා සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය - මාරවිල | හලා/549 | 1986.11.24 |

ඉහත ආකාරයට *ගැසට් පත්‍රයේ* සඳහන් වුවත් මෙම සමුපකාර සමිතියේ නිවැරදි ලියාපදිංචි නාමය සීමාරහිත තල්විල ශාන්ත තෙරේසා සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය වේ. සමුපකාර සමිතියේ ලියාපදිංචි නාමය *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා ඉදිරිපත් කරන අවස්ථාවේ දී මුද්‍රණ දෝෂයක් සහිතව ඉදිරිපත් වී ඇති බැවින් ඉහත සඳහන් ආකාරයට *ගැසට්* පත්‍රයේ පළ වී ඇත. එම දෝෂය නිවැරදි කරනු වස් 2015 දෙසැම්බර් 11 දිනැති අංක 1945 දරන *ගැසට් පත්‍රයේ* පළාත් සභා නිවේදන යටතේ වයඹ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ලියාපදිංචි අවලංගු කළ සමුපකාර සමිති ලේඛණය යටතේ අනු අංක 208 හි පෙර ලියාපදිංචිය හලා/549 අංක දරන සී./ස. තල්විල ශාන්ත තෙරේසා සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය ඈවර අවසන් සමුපකාර සමිති නාම ලේඛනයෙන් ඉවත් කර ගනු ලබන බව මෙයින් නිවේදනය කරමි.

ඩී. එම්. කේ. සී. දිසානායක,
සමුපකාර සංවර්ධන කොමසාරිස්/
රෙජිස්ට්‍රාර් (වයඹ).

08-995

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## මධ්‍යම පළාත් සභාවේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමුපකාර සංවර්ධන නිලධාරී III ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2019

මධ්‍යම පළාත් සභාවේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන සේවා ගණයෙහි සමුපකාර සංවර්ධන නිලධාරී III ශ්‍රේණියේ තනතුරේ පුරප්පාඩු පිරවීම සඳහා මධ්‍යම පළාත තුළ පදිංචි සුදුසුකම්ලත් ස්ත්‍රී / පුරුෂ දෙපාර්ශවයෙන්ම අයැදුම්පත් කැඳවනු ලැබේ.

1. *පොදු සුදුසුකම්*.-

   1.1. අයැදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

   1.2. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

   1.3. මධ්‍යම පළාතේ ඕනෑම ප්‍රදේශයක පදිංචි අයැදුම්කරුවෙකුට ඉල්ලුම් කළ හැකිය. අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට මෙම අයැදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට පූර්වාසන්නයෙන් වූ වසර 03 ක කාලය තුළ මධ්‍යම පළාත තුළ අඛණ්ඩ පදිංචියක් තිබිය යුතුයි. (අයැදුම්කරු මෙම පළාතේ වසර 03ට වඩා ස්ථිර පදිංචි අයෙකු සමග විවාහ වූ විට කලත්‍රයාගේ පදිංචිය සළකා බලනු ලැබේ.)

1.4. අයැදුම්පත් කැඳවන අවසන් දිනට වයස අවුරුදු 18 ට නො අඩු සහ අවුරුදු 30 ට නො වැඩි විය යුතුය.

1.5. සෑම අයැදුම්කරුවෙකුම මධ්‍යම පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

1.6. සේවයට බඳවා ගැනීමට අවශ්‍ය සියලු සුදුසුකම් හා කොන්දේසි, බඳවා ගැනීම සඳහා අයැදුම්පත් කැඳවීමට ප්‍රසිද්ධ කරනු ලබන දැන්වීමේ සඳහන් දිනට සෑම අතින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

2. *අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම්.-*

සියලු අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් 2019.09.27 දිනට සම්පූර්ණ කර තිබිය යුතුය.

2.1. *අධ්‍යාපන සුදුසුකම් :*

2.1.1. සිංහල/ දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් 06කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම.

*සහ*

ආර්ථික විද්‍යාව, කෘෂි විද්‍යාව, සංයුක්ත ගණිතය, ගණකාධිකරණය, ව්‍යාපාර සංඛ්‍යානය, ව්‍යාපාර අධ්‍යයනය යන විෂයයන්ගෙන් එක් විෂයයක් හෝ විෂයයන් කිහිපයක් සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාග යේදී නව විෂය නිර්දේශය යටතේ සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා ඉංග්‍රීසි විෂය හැර) එකවර සමත්ව තිබීම / පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් 03කින් එකවර සමත්ව තිබීම.

2.2. *වෘත්තීය සුදුසුකම් :*

(i) ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ උසස් ගණකාධිකරණ හෝ විගණන කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව සමත්ව තිබීම.

*හෝ*

(ii) ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ (AAT) අවසාන අදියර සමත් වී තිබීම හෝ ඒ හා සමාන සුදුසුකම් ලබා තිබීම.

*හෝ*

(iii) පිළිගත් විශ්ව විද්‍යාලයකින් ගණකාධිකරණය හෝ කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සමත්ව තිබීම.

*හෝ*

(iv) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ මධ්‍යම පරීක්ෂණය සමත්ව තිබීම.

3. *වැටුප් පරිමාණය :*

3.1. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 හි MN 3- 2016 අනුව මධ්‍යම පළාත් සමුපකාර සංවර්ධන නිලධාරී සේවයේ III ශ්‍රේණියට හිමි වැටුප් පරිමාණය.

රු. 31,040 - 10 x 445 -11 x 660- 10 x 730 - 10 x 750 - රු 57,550 - හිමිවන අතර වැටුප් ගෙවීම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි II වන උපලේඛනය අනුව සිදු කරනු ලබයි.

4. *බඳවා ගැනීමේ කොන්දේසි :*

මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2014.06.04 වන දින අනුමත කර ඇති බඳවා ගැනීමේ පරිපාටි අනුව බඳවා ගැනීමේ කොන්දේසි තීරණය වේ.

5. *බඳවා ගැනීමේ ක්‍රමය :*

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90 හි විධිවිධාන පරිදි දිස්ත්‍රික් ජනගහන අනුපාතය අනුව ඉහත පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ. මේ සඳහා මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයේදී ලබා ගන්නා ලකුණු ප්‍රමුඛතාවය මත සුදුසුකම් පරීක්ෂා කර බැලීමේ සම්මුඛ පරීක්ෂණයකින් අනතුරුව සුදුස්සන් තෝරා ගැනේ. සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දීමක් සිදු නොවන අතර ලිඛිත විභාගයේදී එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා 40%ක අවම ලකුණු ප්‍රමාණයක් ලබා නොගන්නා අයදුම්කරුවන් බඳවා ගැනීම සඳහා සළකා බලනු නොලැබේ.

6. *සේවා කොන්දේසි :*

6.1. මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රම පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතුය.

6.2. අදාළ පත්වීම රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට අදාළ අනෙකුත් චක්‍රලේඛවල සඳහන් විධිවිධානවලට යටත්වේ.

6.3. මෙම තනතුරට පත් කිරීමෙන් අනතුරුව මධ්‍යම පළාත තුළ වසර 05 ක අවම වශයෙන් සේවා කාලයක් අනිවාර්යයෙන් සේවය කළ යුතු අතර එම කාලය තුළදී මධ්‍යම පළාතෙන් පිටතට ස්ථාන මාරු ලබා ගැනීමට කරනු ලබන කිසිදු ඉල්ලීමක් සළකා බලනු නොලැබේ.

7. *අයදුම් කිරීමේ ක්‍රමය :*

7.1. විභාග ගාස්තුව රු. 600 කි. මෙම විභාග ගාස්තුව මධ්‍යම පළාතේ ප්‍රධාන ලේකම්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 ට බැරවන පරිදි මධ්‍යම පළාත තුළ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා ඒ සඳහා ලබාගත් ලදුපතක් (නිල් පැහැති) අයදුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. එකී ලදුපත නොමැතිව එවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර ගෙවන ලද විභාග ගාස්තු කිසිම හේතුවක් මත හෝ ආපසු ගෙවනු නොලබන බව ද සැළකිය යුතුය.

7.2. අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුව නිවැරදිව සම්පූර්ණ කොට 2019.09.27 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ''**ලේකම්, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 244, කටුගස්තොට පාර, මහනුවර**'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් ලද බව දන්වනු නො ලැබේ. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "**මධ්‍යම පළාත් සභාවේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමුපකාර සංවර්ධන නිලධාරී III ශ්‍රේණියට බඳවා ගැනීම - 2019**" යනුවෙන් සහ පදිංචි දිස්ත්‍රික්කය සඳහන් කළ යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේදී අස්ථානගත වන අයදුම්පත් සම්බන්ධයෙන් මෙම කොමිෂන් සභාව වග කියනු නොලැබේ.

8. *විභාග මාධ්‍යය :*

විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. අයදුම් පත්‍රයේ තමන් විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයට නියමිත අක්ෂරය පැහැදිලිව සඳහන් කළ යුතු අතර එය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නො ලැබේ.

9. *විභාග මධ්‍යස්ථානය :*

විභාග මධ්‍යස්ථානය පිළිබඳව මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අයදුම්කරුවන්ට විභාග ප්‍රවේශ පත්‍රය මගින් දැනුම් දෙනු ලැබේ.

10. *ලිඛිත විභාගයේ විෂයයන් :*

10.1. මෙම තනතුරුවලට බඳවා ගැනීම සඳහා අයදුම්කරුවන් පහත සඳහන් විෂයයන් යටතේ ලිඛිත විභාගයකට යොමු කරනු ලැබේ.

| *විෂයයන්* | *විෂය නිර්දේශය* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයින්ගේ සිතීමේ තර්කානුකූල භාවයන් ද, විශ්ලේෂණ හැකියාවන් ද, තීරණ ගැනීමේ ශක්තිය ද, විනිශ්චය කිරීම සඳහා බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීම් වලින් ප්‍රශ්න 50 කින් සමන්විත වේ. | පැය 01යි | 100 | 40% |
| 2. *සාමාන්‍ය දැනුම* | *(අ)* ජාතික හා ජාත්‍යන්තර සමාජ, ආර්ථික හා දේශපාලන දැනුම.<br>*(ආ)* සමුපකාර දර්ශනය හා ව්‍යාපාර පිළිබඳ දැනුම යනාදිය පිළිබඳ බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීම් වලින් ප්‍රශ්න 50කින් සමන්විත වූ ප්‍රශ්න පත්‍රයකි. | පැය 01යි | 100 | 40% |

11. *අයදුම්පත් පිරවීම සඳහා උපදෙස් :*

ආදර්ශ අයදුම්පත් ආකෘතියට ප්‍රකාර ඒ 4 ප්‍රමාණයක කඩදාසිය දෙපැත්තම භාවිතා කරමින් එහි පළමු පිටුවෙහි අංක 1-5 දක්වා කරුණු ද අනෙක් පිටුවල ඉතිරි ඡේද ද ඇතුළත් වන සේ සකස් කර ගත යුතුය. අයදුම් පත්‍රය යතුරු ලියනය කර ගැනීමෙන් හෝ පැහැදිලි අත් අකුරින් සකස් කර ගත යුතුය.

11.1 අයදුම් කරන දිස්ත්‍රික්කය ලෙස සඳහන් කළ යුත්තේ අයදුම්කරුගේ ස්ථිර පදිංචිය ඇති දිස්ත්‍රික්කයට අදාළ සංකේත අංකයයි.

| | | |
|---|---|---|
| මහනුවර | - | 01 |
| මාතලේ | - | 02 |
| නුවරඑළිය | - | 03 |

11.2 අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු හෝ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 ශ්‍රේණිගත කිරීමට අනුව තෘතීය හෝ ජ්‍යෙෂ්ඨ මට්ටමේ රජයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

11.3 යම් අයදුම්කරුවෙකුට සුදුසුකම් නොමැති බව පත්වීම් ලැබීමට පෙර හෝ පත්වීම් ලබා දීමෙන් පසු හෝ ඕනෑම අවස්ථාවකදී අනාවරණය වුවහොත් අපේක්ෂකත්වය හෝ පත්වීම අවලංගු කෙරෙනු ඇත. එසේම දැන දැනම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින් යටපත්කර ඇති බව හෝ අනාවරණය වුවහොත් සේවයෙන් පහ කෙරෙනු ඇත.

11.4 රාජ්‍ය / පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

12. *අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය.-*

තමා පෙනී සිටින විභාගය සම්බන්ධයෙන් විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් අපේක්ෂකයෙකු විභාග ශාලාවේදී තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත ලේඛන පමණක් පිළිගනු ඇත.

- පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත.
- වලංගු රියදුරු බලපත්‍රය.
- වලංගු විදේශ ගමන් බලපත්‍රය.

මෙම නිවේදනයේ ආවරණය වන / නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ද මෙම විභාගය පැවැත්වීම පිළිබඳව හෝ පැවැත්වීමෙන් පසුව තෝරා ගැනීම් කිරීම / නොකිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳව අවසාන තීරණය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය. එසේම මෙම නිවේදනයේ විධිවිධාන සලසා නැති කිසියම් කරුණක් වෙතොත් ඒ ගැන පැහැදිලි කිරීම / තීරණය කිරීම මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය නිවේදන අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම්, එවැනි විටෙක සිංහල මාධ්‍ය නිවේදනය අනුව කටයුතු කළ යුතුය.

මෙම බඳවා ගැනීම් සම්බන්ධ වැඩිදුර විස්තර මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.psc.cp.gov.lk හි පළකර ඇති අතර අදාළ අයදුම්පත්‍රය ද එහි දී භාගත කරගැනීමට හැකි බවද කාරුණිකව දන්වමි.

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,

එම්. ජී. ඒ. තිලකරත්න,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත් සභාව.

2019 අගෝස්තු මස 28 වැනි දින,
අංක 244, කටුගස්තොට පාර,
මහනුවර.

**ආදර්ශ අයදුම්පත්‍රය**

*මධ්‍යම පළාත් සභාවේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමුපකාර සංවර්ධන නිලධාරී III ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2019*

විභාග අංකය : [ ]

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :- [ ] ( සිංහල - S, දෙමළ - T, ඉංග්‍රීසි - E )
(අදාළ සංකේතය කොටුව තුළ ලියන්න.)

01. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කයට අදාළ සංකේත අංකය : [ ] ( මහනුවර - 01, මාතලේ - 02, නුවරඑළිය - 03 )

1.1 මුලකුරු සමඟ නම : ..........................................................................................
Mr./Mrs./Miss (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.2 මුලකුරු සමඟ නම : ..........................................................................................
මයා/මිය/මෙනවිය (සිංහලෙන්/දෙමළෙන්)

1.3 මුලකුරුවලින් හැඳින්වෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..........................................................
..........................................................................................

1.4 මුලකුරුවලින් හැඳින්වෙන නම් (සිංහලෙන්/දෙමළෙන්) : ..........................................................
..........................................................................................

02. 2.1 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) : ..........................................................

2.2 ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) : ..........................................................
..........................................................................................

2.3 ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..........................................................
..........................................................................................

2.4 දැනට රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයෙකු නම් කාර්යාලයීය ලිපිනය : ..........................................................
..........................................................................................

2.5 දුරකථන අංකය : ..........................................................................................................................................................................

03. 3.1 උපන් දිනය :..........................................................................................

3.2 අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට වයස ( 2019.09.27 ) වයස : අවු :............., මාස :..............., දින :............

3.3 ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

04. ස්ත්‍රී/පුරුෂ භාවය : ..........................................................................

05. 5.1 අයදුම්කරු ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : ..........................................................................................

| *ඡන්ද හිමි නාම ලේඛනයට අනුව පදිංචිය* | *2016* | *2017* | *2018* | *2019* |
|---|---|---|---|---|
| මැතිවරණ කොට්ඨාශය | | | | |
| ඡන්ද ප්‍රදේශය | | | | |
| ඡන්ද කොට්ඨාශය | | | | |
| ග්‍රාම නිලධාරී කොට්ඨාශ අංකය | | | | |
| ගෘහ අංකය | | | | |
| නමට ඉදිරියෙන් ඇති පිළිවෙල අංකය | | | | |

06. *අධ්‍යාපන සුදුසුකම්.-*

6.1 අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගය :

වසර :..................................... විභාග අංකය :....................................

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

6. 2 අ.පො.ස (උසස් පෙළ) විභාගය :

වසර :..................................... විභාග අංකය :....................................

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |

07. *වෘත්තීය සුදුසුකම්.-*

| *වෘත්තීය සුදුසුකම සම්පූර්ණ කළ ආයතනය* | *සම්පූර්ණ කර ඇති වෘත්තීය සුදුසුකම* | *කාල සීමාව* | *සාමාර්ථය* | *සහතිකපත් අංකය හා දිනය* |
|---|---|---|---|---|
| | | | | |

08. වෙනත් සුදුසුකම් : ........................................................................................................................................................................

09. *විභාග ගාස්තු ගෙවීම පිළිබඳ තොරතුරු.-*

(i) විභාග ගාස්තු ගෙවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නම : ..........................................................................................
(ii) දිනය :..........................................................................................
(iii) කුවිතාන්සි අංකය :-..........................................................................................

( මුදල් ගෙවා ලබාගත් ලදුපත මෙම තීරුව අසලින් අලවන්න. )

*අයැදුම්කරුගේ ප්‍රකාශය :*

මෙම අයැදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. මෙහි සඳහන් කරුණු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව අනාවරණය වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සකු වන බවත්, පත්වීමක් ලැබීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් සේවයෙන් පහකිරීමට යටත් වන බවත් මා දනිමි.

................................... ..............................................
දිනය අයදුම්කරුගේ අත්සන.

**අයැදුම්කරුගේ අත්සන සහතික කිරීම**

මෙම අයැදුම්පත ඉදිරිපත් කරන .......................................................................................................... මහතා/මහත්මිය/මෙනවිය මම පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය අද දින මා ඉදිරිපිටදී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත්, සහතික කරමි.

දිනය :................................... ...................................................
සහතික කරන්නාගේ අත්සන.

සහතික කරන්නාගේ සම්පූර්ණ නම :-..........................................................................................................
තනතුර :-..........................................................................................................
ලිපිනය :-..........................................................................................................

10. රාජ්‍ය / පළාත් රාජ්‍ය සේවාවන්හි දැනට සේවයෙහි නියුතු අයදුම්කරුවෙකු නම් පහත සඳහන් සහතිකය දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් කළ යුතුය.

මෙම අයැදුම්කරු වන .......................................................................................................... මහතා/මහත්මිය/මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ....................................................................................... වශයෙන් සේවය කරයි. පසුගිය වසර 05 තුළ ඔහු/ඇය මොනම ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව සහ ඉහත තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා මුදා හැරිය හැකි බවත් සහතික කරමි.

දිනය :..................................... ..........................................................................................
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව සහිතව)

09-388

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.